# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2014 අංක 29 දරන වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අගෝස්තු මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 අගෝස්තු මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 11.00 යි.    තැපැල් ගාස්තුව **:** රු. 50.00 යි.

# 2014 අංක 29 දරන වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 අගෝස්තු මස 21 වන දින]

එල්.ඩී.—ඕ. (අයි. එන්. සී.) 24/2013.

## වසන්ත සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"වසන්ත සේනානායක පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

තවද, එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලීමක් කර ඇති බැවින්ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 29 දරන වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වසන්ත සේනානායක පදනම සංස්ථාගත කිරීම.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) වසන්ත සේනානායක පදනමේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "වසන්ත සේනානායක පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2-PL 005728—2,150 (2012/05)

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) සංස්ථාවේ අරමුණු වැඩිදියුණු කර ගැනීමෙහිලා යොමුවී සිටින සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම ;

(ආ) ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ස්වකීය අධ්‍යාපන කටයුතු කරගෙන යෑමට නොහැකි ළමුන් සඳහා මුල්‍ය සහ වෙනත් ද්‍රව්‍යමය සහාය ලබාදීම ;

(ඇ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ වෙනත් දේශීය ආයතන සහ සංවිධාන සමග සම්බන්ධීකරණය වීම ;

(ඈ) මහජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව අතර දැනුවත් බවක් ඇති කිරීම සඳහා අදාල අධිකාරීන්ට සහාය වීම ; සහ

(ඊ) පුස්තකාල පවත්වාගෙන යෑමට සහ සංස්ථාවේ අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍යවන සඟරා සහ සමරු කළාප මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම, සහ බෙදා හැරීම සඳහා අදාල අධිකාරීන්ට සහාය වීම;

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් එවැනි හේතුවක් මත කිසිදු වෙනස්කමකට භාජනය නොකර එම පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට සංස්ථාව වගබලා ගත යුතු ය.

(3) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතිවලට යටත් ව සිදු කල යුතු වේ.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්යය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කළ යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය මේ පනතේ විධිවිධානවලට යටත්ව 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) (අ) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලැබූ පදනමේ මණ්ඩලය, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරාගනු ලබන තෙක් සංස්ථාවේ මණ්ඩලය වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී වසර එකක කාලයක් ඇතුළත පත්කිරීම හෝ තෝරාගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් හා උපදේශකවරුන් ඇතුළුව මණ්ඩලයේ සෑම නිලධරයකුම වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලැබීම හෝ තෝරාගැනීම කළ යුතු අතර එම වසර තුනක කාලය අවසන්වීමෙන් පසුව එම නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කිරීම හෝ තෝරාගැනීම සඳහා යෝග්‍ය වන්නේ ය.

(ආ) මියයෑම, ඉල්ලා අස්වීම, අකාර්යක්ෂමතාවය හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා යම් නිලධරයකුගේ ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී මණ්ඩලය විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ පත් කරනු ලැබූ තැනැත්තා තමා අනුප්‍රාප්ත වනුයේ යම් නිලධරයකුගේ ඉතිරි ධුර කාලයක් සඳහා ද එම ඉතිරි ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය වන කවර ආකාරයක හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම් සිදුකිරීම, අලුත්වැඩියා කිරීම, වෙනත් යම් ආකාරයකින් අත්පත් කර ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථය ඉටු කර ගැනීමේ අරමුණ ඇතිව එම දේපල සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඒවා බැහැර කිරීම ;

(ආ) අරමුදල් රැස්කිරීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම :

එසේ වුවද, සංස්ථාවට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළහැකි සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් ලබා දීම, පිටසන් කිරීම, ගණුදෙනු කිරීම, මිලදී ගැනීම, විකිණීම, සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම ;

(ඈ) කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට, සංස්ථාවේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් ආයෝජනය කිරීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කිසියම් නීත්‍යානුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළි ගැනීම, ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, සේවයෙන් ඉවත් කිරීම, සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ අදාළ ලිඛිත නීතිවලට අනුකූලව සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඔවුන් සඳහා වැටුප්, දිරි දීමනා සහ පාරිතෝෂික ගෙවීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු පැවැත්වීම.

(ඌ) සංස්ථාවේ අරමුණට සමාන අරමුණක් ඇති දේශීය සහ විදේශීය ආයතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි දී තැනැත්තන් පුහුණු කිරීම ; සහ

(ඒ) සංස්ථාවේ අරමුණ නිසි පරිදි හා ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන හෝ උපයෝගී වන වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම, සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය අස් කර ගැනීම, සාමාජිකත්වයෙන් නෙරපීම හෝ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජිකත්ව ගාස්තු ;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ධුරය හිස් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීමේ නියම හා කොන්දේසි, බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) මණ්ඩලයේ හෝ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ හා මණ්ඩලයේ සාමාජිකයකු බවට පත්වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි අරමුණු සාක්ෂාත් කරගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සියලුම අවස්ථාවන්වලදී සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදන ලද රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන් ලියාපදිංචි කිරීම.

8. සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල් ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලුම මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ප්‍රමාණයක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මෙම පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් රජයේ විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් පත්කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්:—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද ;

එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) මණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය යම් වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ හය මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට සංස්ථාව විසින් ලබාගත් විදේශීය සහ දේශීය මුදල්වලට අදාළ වෙනම ගිණුම් වාර්තාවක් අමුණා තිබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති පදනම විසින් ගෙවිය යුතු සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව මගින් චංචල හෝ නිශ්චල දේපළ දැරීම.

**13.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා හැකියාව සහ බලය ඇති අතර, එවැනි සියලු දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ විධිවිධාන සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

**14.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාවේ මුදල් හා දේපල මෙහි සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර එහි යම් කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුවම හෝ වක්‍රව සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය. මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

**15.** (1) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් එම සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

(2) සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මණ්ඩලයේ ධුර දරන්නෙකු භාරයේ තැබිය යුතු ය.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

(2) (1) උපවගන්තියේ අරමුණ සඳහා සුදුසු ආයතනයක් සංස්ථාව විසුරුවා හැරීමට ප්‍රථමව කැඳවනු ලබන මහ සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

**17.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**18.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.